පාදෙණිය - අනුරාධපුර මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2014

-----------------------------------------------------------------------------

පාදෙණිය - අනුරාධපුර මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදල සඳහා රජයේ නියෝජිතායතනය වන කොරියානු අපනයන හා ආනයන බැංකුව අතර 2008 දෙසැම්බර් 19 දින එළඹි අංක එස්ආර්අයි- 18 දරන ණය ගිවිසුමේ 1 ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වන්නේ පිළිවෙලින් එවකට මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය සහ මාර්ග සංවර්ධන අධිකාරිය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ (අ) ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ ප්‍රධාන ප්‍රවාහන කේන්ද්‍රයේ පිහිටා ඇති පාදෙණිය - අනුරාධපුර මාර්ගයේ මාර්ග කොටස වැඩිදියුණු කිරීම මඟින් ප්‍රදේශ අතර භාණ්ඩ භුවමාරුව හා මහජන සම්බන්ධතා ක්‍රියාත්මක කිරීමට මෙන්ම ජාතික ආර්ථික සංවර්ධනය වැඩිදියුණු කිරීම සහ සමාජ පිරිවැය කපාහැරීම සහ කර්මාන්ත තරඟකාරීත්වය ඉහළ නැංවීම මඟින් ප්‍රාදේශීය සංවර්ධනය සමතුලිත කිරීම සහ (ආ) කටුනායක - පාදෙණිය මාර්ග කොටසට මාර්ගය සම්බන්ධ කිරීමටද සැලසුම් කර ඇති අතර කටුනායක පිහිටි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සහ සංස්කෘතික උරුමයන්ගෙන් හා සංචාරක ආකර්ෂණයෙන් පරිපූර්ණ වූ ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාත අතර මඟී ප්‍රවාහන පහසුකම් ඇති කරලීම මඟින් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයෙහි ජාත්‍යන්තර තරඟකාරීත්වය ශක්තිමත් කිරීමටද අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 9,670 ක් වන අතර ඉන් එජඩො මිලියන 55 කට සමාන රු.මිලියන 7,554.03 ක මුදලක් මූල්‍යයනය කිරීමට ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදල එකඟ වී තිබුණි. 2012 නොවැම්බර් මාසයේදී රු.මිලියන 1,232.90 කට සමාන එජඩො මිලියන 11.32 ක අතිරේක ණය මුදලකින් ආරම්භක ණය මුදල වැඩිකර තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2009 ජුලි 01 දින ආරම්භ කර තිබුණු අතර 2012 ජනවාරි 01 දින වන විට මාස 30 ක් තුළ නිම කිරීමට සැලසුම් කර තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2012 නොවැම්බර් 30 දින නිමකර තිබුණද, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

2. මූල්‍ය ප්‍රකාශන
----------------

2.1 මතය
--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බවත්ය.

3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය
------------------------------------

3.1 අරමුදල් උපයෝජනය
------------------------

අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ සහ 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | **2014 වර්ෂය තුළ** උපයෝජනය කළ අරමුදල් | **2014 දෙසැම්බර් 31** දක්වා උපයෝජනය කළ අරමුදල් |
|---|---|---|---|---|---|
| | එ ජ ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදල | 66.32 | 8,786.93 | - | - | 9,292.15 |
| ශ්‍රී ලංකා රජය | - | 2115.97 | 50.00 | 17.70 | 1,304.55 |
| එකතුව | 66.32 | 10,902.90 | 50.00 | 17.70 | 10,596.70 |

3.2 භෞතික ප්‍රගතිය

---------------------

මාර්ගයේ ප්‍රතිසංස්කරණ වැඩ නිමකර 2012 නොවැම්බර් 30 දින මාර්ග සංවර්ධන අධිකාරියට භාරදී තිබුණි. කෙසේ වුවද 2014 දෙසැම්බර් 31 වන විටත් ව්‍යාපෘතියේ කාර්යයන් වසා දැමීමට ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය විසින් කටයුතු කර නොතිබුණි.

3.3 ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු

------------------------------------------

ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 08 ක රජයේ ඉඩම් ද ඇතුළුව ඉඩම් කැබලි 1,763 ක් අත්පත් කරගැනීමට අපේක්ෂා කර තිබුණි. කෙසේවුවද ඉඩම් කැබලි 984 ක් සඳහා පමණක් 2014 දෙසැම්බර් 31 දිනට වන්දි ගෙවා තිබුණි. ඉන් ඉඩම් කැබලි 707 ක් පමණක් ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 44 වගන්තිය ප්‍රකාරව ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කර තිබුණි. තවද ඉඩම් අයිතිකරුවන්ට වන්දි ගෙවීමේ ප්‍රමාදය හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 3.46 ක පොලී ගෙවීමට ව්‍යාපෘතියට සිදුවී තිබුණි.